# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022**
**2024 දෙසැම්බර්/ 2025 ජනවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

## වාස්තුශාස්ත්‍ර
**(නව නිර්දේශය)**

**ගෘහාභ්‍යන්තර සැලසුම්කරණය, ද්වාරස්ථාපනය හා මානක්‍රම**
**VAST – 28224**

පළමු හා දෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ඇතුළත් වන ලෙස ප්‍රශ්න **පහකට (05) පමණක්** පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

### I කොටස

01. (අ). මානාංගුලය හා මාත්‍රාංගුලය අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 10යි.)

(ආ). වාස්තුශාස්ත්‍රීය මාන නිර්ණයට අදාළ ප්‍රධාන වර්ගීකරණයන් මූලාශ්‍රයානුසාරී ව විමර්ශනය කරන්න.

(ලකුණු 10යි.)

02. (අ). ශුභ ගෘහ නක්ෂත්‍රය සොයාගනු ලබන ආකාරය ක්‍රමානුකූල ව පැහැදිලි කරන්න.

(ලකුණු 10යි.)

(ආ). අස්විද, කැති, බෙරණ, උත්‍රපල් හා රෙහෙණ යන නැකැත් හි ශුභ ආයයන්ට අදාළ ඓක්‍යය ගණනය කරන්න.

(ලකුණු 10යි.)

03. (අ). චාතුර්වර්ණික රාජපුරුෂයන් අතුරින් බ්‍රාහ්මණ හා වෛශ්‍ය රාජපුරුෂයන්ට අදාළ ගෘහ පරිමාවන් ගෙනහැර දක්වන්න.

(ලකුණු 10යි.)

(ආ). පහත සඳහන් ගෘහ පිණ්ඩයන්හි ශුභ අශුභ පරීක්ෂා කොට, ඒවාට ගැළපෙන සුදුසු දිග හා පළල ද ගණනය කරන්න.

**වර්ගරියන් 767, 857, 959, 1031**

(ලකුණු 10යි.)

04. (අ). ගෘහයක දිග හා පළල ගණනයට අදාළ සිද්ධාන්ත පැහැදිලි කරන්න.

(ලකුණු 10යි.)

(ආ).දොරටුවක පරිමාව ගණනයට අදාළ සිද්ධාන්ත මූලශ්‍රයානුසාරී ව විමර්ශනය කරන්න.

(ලකුණු 10යි.)

## II කොටස

05. (අ). ගෘහයක ද්වාරස්ථාපන සිද්ධාන්තයන්හි විද්‍යාත්මකභාවය පැහැදිලි කරන්න.

(ලකුණු 10යි.)

(ආ). පරමශායික සැලසුමෙහි ප්‍රධාන ද්වාරස්ථාපනයට අදාළ සිද්ධාන්ත පැහැදිලි කරන්න.

(ලකුණු 10යි.)

06. (අ). ගෘහාභ්‍යන්තර සැලසුම් කිරීමේ දී ප්‍රධාන හා අනුදිශාවන්හි සැලසුම් කළයුතු ගෘහාංග වර්ගීකරණය කරන්න.

(ලකුණු 10යි.)

(ආ). නිවසක ගෘහප්‍රධානියාගේ නිදන කාමරය සහ මුළුතැන්ගෙය සැලසුම් කිරීමට අදාළ වාස්තු සිද්ධාන්ත සමාලෝචන කරන්න.

(ලකුණු 10යි.)

07. නැගෙනහිර දිශාවෙන් ප්‍රධාන පාර පිහිටි, උතුරු දිශාවෙන් පාසලක් පිහිටා ඇති පර්චස් 10ක භූමිභාගයක බෑවුම බටහිර දිශාවෙන් පිහිටා ඇත. ගෘහාධිපතිවරයා විදුහල්පතිවරයෙක් වන අතර ඔහුට පාසල් යන එක් ගැහැණු දරුවෙක් හා රැකියාවක නිරත වන එක් පිරිමි පුතෙක් වේ. ඔහුගේ බිරිඳ මැහුම් කටයුතුවල නිරත වේ. ඔවුනට ගැළපෙන ගෘහාභ්‍යන්තර සැලසුමක් වාස්තුශාස්ත්‍රානුකූල ව සැලසුම් කරන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 20යි.)

08. (අ). ආධ්‍යාත්මක සුවය සඳහා නිවසක සුදුසු ම ස්ථානය කුමක් දැ යි හඳුන්වා එහි විද්‍යාත්මක පසුබිම විස්තර කරන්න.

(ලකුණු 10යි.)

(ආ). නූතන අභ්‍යන්තර සැලසුම්කරණ මූලධර්ම නම් කොට, ඒවායෙහි වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 10යි.)